## වී අලෙවි මණ්ඩලය-2011

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.5 ජේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය මගින් මිලදීගෙන තිබූ වී තොග බොහෝ විට අඩු මිලට විකිණීමෙන් ඊළග කන්නයේ වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවාගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් සහ බැංකු වෙතින් ණය ලබාගැනීමේ ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි. මෙම තත්ත්වය හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ.

#### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 අනුව, වී, සෝයා බෝංචි සහ සහල් තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අඩු අගයට ගිණුම්ගත කළ යුතු වුවද, වර්ෂය අවසානයට ප්‍රාදේශීය කළමණාකරුවන්ගෙන් ලබාගත් වාර්තා මත රු.4,555,081,250 කට තොගය අගය කර ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාර පාර්තෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 පරිදි ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, පිරිවැය රු.13,710,714 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එක් ශේෂයක් ලෙස ගෙන ගිණුම්ගත කර තිබුණි. එම පිරිවැය මත වර්ෂයකට සියයට 2.5 බැගින් ක්ෂය කර තිබුණි.

#### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයට පෙර තිබූ වත්කම් හා බැරකම් ශේෂවල එකතුව පිළිවෙලින් රු.277,911,624 ක් හා රු.166,994,520 ක් හඳුනාගැනීමකින් තොරව අවිනිශ්චිත ගිණුමක රඳවා තිබුණු අතර, 2009 වර්ෂයෙන් පසු සිදු වූ ගනුදෙනුවලින් පැන නැගුනු රු. 1,135,701 ක් වටිනා වත්කම් හා රු. 26,239,640 ක් වටිනා බැරකම් ද එම අවිනිශ්චිත ගිණුමේ රඳවා තිබුණි.

(ආ) ණය පොලී ගෙවීම සඳහා සහ වී කෙටුම් කුලී හා ප්‍රවාහන ගාස්තු සඳහා භාණ්ඩාගාරයෙන් ලද පිළිවෙලින් රු. 346,190,000 ක හා රු.110,000,000 කන් පිළිවෙලින් රු.307,263,861 ක් හා රු.91,321,775 ක් පියවා ඉතිරියේ එකතුව වූ රු.57,604,384 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූණි.

(ඇ) ආදායම් ප්‍රකාශනයේ සහල් විකුණුම් පිරිවැය සදොස් ලෙස ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු.601,547,073 කන් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් වසරේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූණි.

(ඈ) ජීවන වියදම් හා ආහාර සුරක්ෂිත කමිටුවේ තීරණය පරිදි රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත, මණ්ඩලයට අයත් රු.1,281,892,217 ක් වටිනා සහල් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල තැන්පත් කිරීම සඳහා බාර දී තිබුණි. එම මුළු සහල් තොගයම සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයෙ විකුණුම් ලෙස ගිණුම් ගත කර තිබුණි. කෙසේ වෙතත්, මෙම මුළු තොගයෙන් රු.611,986,069 ක් වටිනා සහල් තොගයක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් නොවිකිණී ගබඩා වල ඉතිරිව තිබූණි.

(ඉ) ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.182,900,000 ක වූ මුදල ආදායම් ප්‍රකාශනයේ අනිකුත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ලාභය ඊට සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු ගබඩා බදු කුලී රු.3,697,500 ක් ගිණුම්වලින් අත්හැර තිබුණ.

(උ) සමාලෝචිත වර්ෂයේ සිදුකළ ඉදිකිරීම් 08 ක් වෙනුවෙන් ගෙවා තිබුණු රු.71,076,719 ක මුදල කෙරී ගෙන යන වැඩ ලෙස හෝ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත නොකොට මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස පෙන්වා තිබූණි.

(ඌ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති ණයගැති ශේෂ මත ප්‍රමාණවත් බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට පැවත එන රු.10,591,838 ක ද ඇතුළුව, රාජ්‍ය ආයතන 8 කින් ලැබිය යුතු රු.1,086,844,771 කින් 2013 සැප්තැම්බර් 24 දින වන විටත් මණ්ඩලය අයකර ගෙන තිබුණේ රු.579,247,996 ක් පමණි. ඒ අනුව, රු.507,596,775 ක මුදලක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට ආයතන 06 කින් ලැබිය යුතු රු.20,795,578 ක් ද ඇතුළුව, ලැබිය යුතු රු.150,676,283 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට මණ්ඩලය 2013 සැප්තැම්බර් 30 දින තෙක් ක්‍රියාකර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් සඳහන් කර ඇති සාක්ෂි නොමැතිවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 13,710,714 | ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු |
| වී, සෝයා බෝංචි, සහල් සහ මාර්ගස්ථ තොග | 4,555,191,889 | තොග ලේඛන, තොග සමීක්ෂණ වාර්තා, මාර්ගස්ථ තොග සනාථ කිරීමේ ලියවිලි |
| සහල්, වී සහ සෝයා බෝංචි විකුණුම් ණය ගැතියෝ | 1,086,844,771 | ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් |
| බැංකු ණය හා භාණ්ඩාගාර අත්තිකාරම් | 5,487,454,030 | කාල විශ්ලෙශණ, ශේෂ සනාථ කිරීම් |
| බැංකු අයිරාව | 247,131,449 | අනුමැතිය ලබාගැනීමට අදාල විස්තර, ශේෂ සනාථ කිරීමේ ලියවිලි, කාල විශ්ලේෂණ |
| ආයෝජන | 283,044,402 | ආයෝජන සහතික හා කාල විශ්ලේෂණ |

| | | |
|---|---|---|
| ආයෝජන පොලී ආදායම් | 14,549,943 | පොලී ආදායම් ගණනය කළ ආකාරය |

**1.2.6 නීත, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීත, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඩී) වගන්තිය | විගණකාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව අවම අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ 135 - 139 | මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පැවරීම හා මූල්‍ය බලතල බෙදීමක් මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි. |
| (ii) මු.රෙ 188 (2) | සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ තැන්පත් කළ රු.12,140,745 ක් වටිනා චෙකපත් 07 ක් 2012 අගෝස්තු මාසය වන විටත් උපලබ්ධි වී නොතිබීම සම්බන්ධයෙන් නීතී ක්‍රියාමාර්ග ගෙන ඇති බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණද, එම චෙක්පත් 2013 සැප්තැම්බර් 30 දක්වාම නිරවුල් වී නොතිබුණි. |
| (ඇ) 2007 ජූලි 25 දිනැති අංක 07/1199/315/31 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය ඈවර කර අධිකාරිය සතු සියළුම වත්කම් හා බැරකම් 2007 ජූලි 25 දින නැවත ආරම්භ කළ මණ්ඩලය වෙත පවරා ගත යුතු වූවත්, රු.184,658,970 ක් වූ ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, අතැති මුදල් ශේෂ, සේවක අත්තිකාරකම් යනාදී වත්කම් පමණක් පවරාගෙන තිබූ අතර, අනෙකුත් |

| | |
|---|---|
| | වත්කම් හා වගකීම් පවරා ගැනීමට හා අධිකාරයේ ඈවර කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පර්ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 | එකතුව රු. 13,710,714 ක් වූ ස්ථාවර වත්කම් වර්ෂ 6 කට වැඩි කාලයක සිට සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඊ) 2010 දෙසැම්බර් 16 දිනැති අංක අමප/10/2762/447/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු. මිලයන 2,000 ක් වූ අත්තිකාරම් මුදල් සහල් අලෙවියෙන් ලද මුදලින් පියවීමට කටයුතු කළ යුතු වූවද, සමාලෝචිත වර්ෂය තුළ සහල් අලෙවියෙන් ලද රු. 708,232,048 ක මුදලන් මෙම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදය | බඳවා ගත් නිලධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු අසම්පූර්ණ හෙයින් ඒ තළ වෛද්‍ය වාර්තා, වැටුප් වර්ධක අනුමත කිරීම්, රාජකාරී වැඩ හා හැසිරීම් සතුටුදායක ලෙස ඉටුකළ වාර්තා යනාදීය ඇතුළත් වී නොතිබුණි. |
| (ඌ)1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | ඉහත සඳහන් නිලධාරීන් 04 දෙනා විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ලාභය රු.264,125,792 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.346,747,035 වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 610,872,827 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කෙසේ නමුදු මෙම වාර්තාවේ 2.2.3 හි (ආ) සිට (ඊ) ඡේදවලින් දැක්වෙන ලාභය වැඩියෙන් දැක්වීම වු රු.මිලියන 247 ක මුදල ගලපන ලද්දේ නම් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 264 ක් වු ලාභය රු.මිලියන 17ක් දක්වා අඩුවනු ඇත.

## 2.2 වියදම් වල අසාමාන්‍ය වැඩි වීම

2011 වර්ෂය තුළ මණ්ඩලය ණය මුදල් මත දැරූ මුලු මූල්‍ය පිරිවැය රු.329,644,154 ක් වූ අතර, එය මුළු ආදායම වූ රු.631,978,105 හි ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 52 ක් විය. කෙසේ නමුත්, 2011 වර්ෂයේ ආදායම තුළ රු. 554,090,000 ක භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් විය. ඒ අනුව, එය ඉවත් කර ශුද්ධ මෙහෙයුම් ආදායම් වූ රු. 77,888,105 සමඟ සසඳන ලද්දේ නම් මුළු මූල්‍ය පිරිවැය මුළු ආදායමෙන් සියයට 423 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 11,955 ක් වැය කර වී මෙට්‍රික් ටොන් 400,000 ක් මිලදී ගැනීම සඳහා ඉලක්ක කර තිබුණද, රු.මිලයන 2,278 ක් වැය කර වී මෙට්‍රික් ටොන් 80,144 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 20 ක් වී තිබුණි. වී මිලදී ගැනීම ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සියයට 47 ක පිරිහීමක් විය.

(ආ) 2011 වර්ෂයේ යල හා මහ කන්නවල වී මිලදී ගැනීම්වලින් පිළිවෙළින් සියයට 78 ක් හා සියයට 84 ක ප්‍රතිශතයකින් මණ්ඩලය විසින් නාඩු වී මිලදී ගෙන තිබුණත් දේශීය වශයෙන් වැඩිපුර පරිභෝජනය කරනු ලබන සම්බා සහල් මිලදී ගැනීමට මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය අඩු වී තිබුණි. මණ්ඩලය මිලදී ගත් වී වර්ග ප්‍රතිශතයන් අනුව පහත දැක්වේ.

| කන්නය | සම්බා | නාඩු | මුළු මිලදී ගැනුම් | මුළු වී මිලදී ගැනීම්වලින් එක් එක් වී වර්ග මිලදී ගැනීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|

| | මෙ.ටො. | මෙ.ටො. | මෙ.ටො | සම්බා<br>-------<br>% | නාඩු<br>-------<br>% |
|---|---|---|---|---|---|
| යල | 16,516.9 | 60,103.9 | 76,620.8 | 22 | 78 |
| මහ | 556.6 | 2,967.4 | 3,524.0 | 16 | 84 |

(ඇ) වී මිලදී ගැනීමේ වැඩසටහන අනුව, සමස්ත වී නිෂ්පාදනයෙන් අවම වශයෙන් සියයට 5 - සියයට 10 අතර ප්‍රතිශතයකින් මණ්ඩලය විසින් සෘජුව ගොවීන්ගෙන් වී මිලදී ගැනීම රජයේ ඉලක්කගත සැලැස්ම වුවත්, එම ඉලක්කයට ලඟා වීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. ලබා දෙන ලද තොරතුරු අනුව, 2010 යල කන්නය හැරුණු විට මුළු වී නිෂ්පාදනයෙන් වී මිලදී ගැනීමේ ප්‍රතිශතය සියයට 5 ට වඩා අඩු මට්ටමක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| | 2009/2010<br>මහ<br>-------------<br>මෙ.ටොන් | 2010<br>යල<br>-----------<br>මෙ.ටොන් | 2010/2011<br>මහ<br>------------<br>මෙ.ටොන් | 2011<br>යල<br>----------<br>මෙ.ටොන් | එකතුව<br><br>---------<br>මෙ.ටොන් |
|---|---|---|---|---|---|
| මුළු නිෂ්පාදනය | 2,630,000 | 1,671,000 | 1,996,000 | 1,879,000 | 8,176,000 |
| මණ්ඩලය වී මිලදී ගැනීම | 73,192 | 115,714 | 3,524 | 76,621 | 269,051 |
| මුළු නිෂ්පාදනයෙන් මණ්ඩලය වී මිලදී ගැනීමේ ප්‍රතිශතය | 2.8 | 6.9 | 0.2 | 4.1 | 3.3 |

(ඈ) මණ්ඩලයෙ සම්මත පිළිවෙත අනුව, සහල් නිෂ්පාදනය සඳහා පැරණි වී තොග ප්‍රථමයෙන්ම නිකුත් කළ යුතු වුවද, එය නොසලකා පැරණි තොග ගබඩාවේ තිබියදී, අළුත් වී තොග නකුත් කර තිබුණ අවස්ථා විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත සම්මතයට පටහැනි ලෙස වටිනාකම රු. 73,548,914 ක් වූ පැරණි වී තොග කි.ග්‍රෑම් 2,626,113 ක් ගබඩාව තුළ තිබියදී, එය නොසලකා වටිනාකම රු.85,048,150 ක් වූ අළුත් වී කි.ග්‍රෑම් 3,032,005 ක් නිකුත් කර තිබුණි.

(ii) පැරණි වී තොග නිකුත් නොකර ගබඩාව තුළ රඳවාගෙන තිබීම හේතුවෙන් පැහැය වෙනස් වීම. කෘමි හානි, තොග යල් පැනීම හා නරක්වීම, තොග විනාශවීම, අපද්‍රව්‍ය මිශ්‍රවීම හා ඒවා නඩත්තුව සඳහා මණ්ඩලයට අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

## 3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල ගබඩා කර තිබූ සහල් පෞද්ගලික සමාගම් 04 කට අඩු මිලට විකිණීම නිසා 2011 වර්ෂයේදී රු.මිලියන 369.49 ක අලාභ සිදුවී තිබණි. මෙම විකිණීම මණ්ඩලය විසින් නොකළ බවත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත ආහාර කොමසාරිස් විසින් කර ඇති බවත් මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 3 සහ 10 වගන්ති ප්‍රකාර, වී සහ සහල් කෙටීමේ, පැහීමේ හා සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හා පෞද්ගලික වී මෝල් ලියාපදිංචි කිරීම් කටයුතු ක්‍රියාත්මක කළ යුතුව තිබුණද, ඒ අනුව මණ්ඩලය කටයුතු කර නොතිබූණි. එමෙන්ම අවිධිමත්ව තෝරා ගත් වී මෝල් හිමියන් වෙත රු.1,340,648,888 ක් වටිනා වී වර්ෂය තුළ නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.67,706,816 ක් වටිනා වී තොගයට අදාළ සහල් මණ්ඩලය වෙත ආපසු ලැබී නොතිබුණි. මෙම වී තොගය මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ තොග ලෙස දක්වා තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනදෙනු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් උපයෝජනය කරනු ලබන ගබඩා ගොඩනැගිලි සහ ඊට අයත් භූමි ප්‍රදේශ 142 ක අයිතිය තහවුරු කර ගැනීම සඳහාත්, බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් පාවිච්චි කරනු ලබන ගොඩනැගිල 44 ක නිරවුල් භුක්තිය පවරා ගැනීම සඳහාත් සමාලෝචිත වර්ෂය තුළදී නීතිමය පියවරගෙන නොතිබුණි.

(ආ) සමාලොචිත වර්ෂය තුළ රු.3,255,329 ක මුදලක් වී තොග රක්ෂණය කිරීම වෙනුවෙන් රක්ෂණ ආයතනයකට ගෙවා තිබුණද, රක්ෂණ ආයතනය ලබා දුන් උපදෙස් හා ප්‍රමිතීන්ට අනුව වී තොග ගබඩා නොකිරීම හේතුවෙන් වී තොගවලට සිදු වී තිබූ අලාභ හානි සඳහා වන්දි මුදල් ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

## 3.4 අවිධිමත් ගනදෙන

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදු ගිවිසුමක් මත, බදු දී තිබුණ මණ්ඩලයට අයත් ගබඩා ගොඩනැගිලි 19 න් 07 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණද මෙම ගොඩනැගිලි නැවත පවරා ගැනීමට හෝ බද්ද අලුත් කිරීමට

කටයුතු නොකිරීම හේතුවෙන් පැරණි බදුකරුවන් 2013 සැප්තැම්බර් 30 දින දක්වාත් ගෙවීමකින් තොරව ගොඩනැගිලි පරිහරණය කරමින් තිබුණි.

(ආ) එම ගොඩනැගිලි 19 න් 16 ක බදු කුලී සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඟ හිට තිබුණු අතර, හිඟ හිටි කුලිය රු. 5,173,950 ක් විය. මෙයින් රු.3,641,250 ක් ම වර්ෂ 02 සිට වර්ෂ 05 ට වැඩි කාලයක සිට හිඟ හිටිව තිබුණ. මෙම හිඟ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර 2013 ඔක්තෝබර් 14 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) ගබඩා ගොඩනැගිලි 04 කින් එකතුව රු. 3,036,400 ක් වූ පැරණි හිඟහිටි බදු කුලී අයකර ගැනීමෙන් තොරව 2011 වර්ෂයට අදාල බදු පමණක් අයකර තිබුණි.

(ඈ) මණ්ඩලයෙ පූර්ව අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් විසින් ගොඩනැගල්ලකට කරන ලද නවීකරණ කටයුතු වෙනුවෙන් වැය කර තිබූ රු.6,314,659 ක් වූ මුදල බදු කුලියෙන් මාසිකව රු. 30,000 බැගින් හිලව් කිරීමට ඉඩ දී තිබුණි. ඒ අනුව මණ්ඩලයට අහිමි වූ මුළු බදු කුලිය රු.360,000 ක් විය.

## 3.5 ද්‍රව්‍ය අක්‍රමිකතා

-----------------

මණ්ඩලය විසින් මෝල් හිමියන් වෙත නිකුත් කර තිබූ වී තොග සම්බන්ධයෙන් පහත සඳහන් අක්‍රමිකතා නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලය විසින් ගිවිසුම් ප්‍රකාරව මොල් හිමියන් වෙත වී තොග නිකුත් කිරීමට පෙර පිළිගත් බැංකුවකින් දින 90ක වලංගු කාලයක් සහිතව කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ලබාගත යුතු වුවද, කිසිදු මොල් හිමියෙකු වෙතින් එවැන්නක් ලබාගෙන නොතිබුණි. මෙම බැංකු ඇපකරය වෙනුවට දිනයක්, වටිනාකමක් නොදැක්වෙන හිස් චෙක්පත් මණ්ඩලය විසින් ලබාගෙන රු.1,340,648,888 ක් වටිනා වී මොවුන් වෙත නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, මේ තුළින් රාජ්‍ය මුදල් අවභාවිතයට නොයෙදුනේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) සමහර මොල් හිමියන් විසින් ඉදිරිපත් කර තිබූ චෙක්පත් සඳහා විවිධ හේතු මත බැංකු විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් මෙම මෝල්හිමියන්ට එරෙහිව කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් 2013 ඔක්තෝබර් 14 දින වන විටත් ගෙන නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව, ගෙවීම් ප්‍රතික්ෂේප වූ චෙක්පත් වල වටිනාකම රු. 3,742,220 ක් විය.

(ඇ) වී තොග ගබඩාවලින් නිකුත් කිරීමේදී නිකුත් නියෝගවල පිටපත් හා ගබඩාවලින් නිකුත් කිරීමේ දී නිකුත් කුවිතාන්සි නිරන්තරව සංසන්දනය කොට ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම, නිසි වාර්තා තබා නොගැනීම, අවිධිමත් ආකාරයෙන් මෝල් හිමියන් තෝරා

ගැනීම හා නිසි පාලන ක්‍රමවේදයන් හඳුන්වා නොදීම නිසා විවිධ ආකාරයේ වංචා හා අක්‍රමිකතාවලට ඉඩකඩ විවර කර තිබුණි.

## 3.6 අනාර්ථික ගනදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් වී විකිණීමෙන් ලැබ මුදල් තැන්පත් කිරීම සඳහා ආරම්භ කර තිබුණු ඉතිරි කිරීමේ ගිණුම 2010 අපෙල් 26 දින සිට මණ්ඩලය වෙත පවරා දී තිබුණු අතර, එදිනට ශේෂය රු. 5,338,284 ක් විය. එදින සිට 2013 සැප්තැම්බර් 30 දින දක්වා මෙම මුදල් ඵලදායි ආයෝජනයක යොදවා නොතිබුණි.

(ආ) ලංකා එකසත් ප්‍රවෘත්ත පත්‍ර සමාගමේ කොටස්වල, මණ්ඩලය විසින් ආයෝජනය කර තිබූ රු.127,000 ක් වටිනා කොටස් 2011 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබූ අතර ඊට හිමි ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.7 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු අයිරා හා ණය ශේෂයන් නොපියවීම මත සමාලෝචිත වර්ෂය තුළ අයිරා පොලී ලෙස රු.22,380,293 ක්ද බැංකු ණය පොලී ලෙස රු.307,263,860 ක්ද මණ්ඩලය විසින් වැය කර තිබූණි.

(ආ) පිරිවැය අධික වීම හේතු ලෙස දක්වමින් වී තොග වාර්ෂිකව සමීක්ෂණය කිරීමට මණ්ඩලය අතපසු කර තිබුණි. මිලදී ගත් වී තොග සම්පූර්ණයෙන්ම නිකුත් කිරීමෙන් අනතුරුව වී තොග ඌනතා ගණනය කිරීම මණ්ඩලයේ ක්‍රියාත්මක පිළිවෙත වී තිබූණි. කෙසේ නමුදු මණ්ඩලයේ වී මිලදී ගැනීමේ මෙහෙයුම් කටයුතු සක්‍රීය කර මණ්ඩලයෙ කාර්ය මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ආරම්භ කර තිබුණු 2009/2010 මහ කන්නයේදී මිලදි ගත් වී තොග 2012 ජූනි 15 දින වන විට බොහෝ ගබඩාවලින් නිකුත් කර අවසන් කර තිබුණු අතර, එම කන්නයේ වී තොග ඌනතා ගණනය කිරීම විගණනයට කළ හැකි විය. ඒ අනුව, අනුරාධපුර කලාපයේ පරීක්ෂාවට ලක් කරන ලද ගබඩා 12 ක වී තොග ඌනතාවය කි.ග්‍රෑම් 296,876 ක් විය. එහි පිරිවැය රු.8,312,528 ක් විය. එහෙයින් මණ්ඩලයට අයත් අනෙකුත් ගබඩා 130 හි මෙවැනිම ඌනතා නොතිබේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

**3.8 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සහා නියෝග ක්‍රියාත්මක නොකිරීම.**

-----------------------------------------------------------------------

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියොග අංක 06 හා 15 ප්‍රකාර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවත්, එතෙක් රේඛීය අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතු වවද ඊට අදාළ වාර්තා කිසිවක් 2013 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නියෝග අංක 14 පරිදි 2008 වර්ෂයට පෙර සිට පැවතෙන හදුනාගත නොහැකි හා අයකර ගත හැක ණයගැති ශේෂ, හදුනාගැනීමට කමිටුවක් පත් කර, එම කමිටුවේ නිර්දේශ මත හා නිසි අනුමැතියක් මත ලියා හැර නව ශේෂ පත්‍රයක් සකස් කළ යුතු වූවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත කී නියොග ප්‍රකාර ඉදිරියට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හදුනා ගත හැකි ස්ථාවර වත්කම් හා අනෙකුත් වත්කම් පිළිබඳ ලේඛන සකස් කිරීමට අපේක්ෂා කළද, විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම් සඳහාද විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට මණ්ඩලය අපොහොසත් වීම හේතුවෙන් එම අවශ්‍යතාවය තවදුරටත් ඉටු වී නොතිබුණි.

**3.9 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 134 ක් වූවද, 2011 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්තව සිටි කාර්ය මණඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබූණි.

(අ) මධ්‍ය කළමණාකරණ මට්ටමේ ප්‍රාදේශීය කළමණාකරු අනුමත තනතුරු සංඛ්‍යාව 07 ක් වූ අතර, එම සියළු තනතුරු පුරප්පාඩුව පැවතුණි. එම තනතුරුවල වැඩ ආවරණය කිරීම සඳහා සහකාර ප්‍රාදේශීය කළමණාකරුවන් පත් කර, වර්ෂ 03 කට වැඩි කාලයක් ගතවී තිබූණද, එම තනතුරු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් වී තොග ගබඩා කිරීම සඳහා පරිහරනය කෙරෙන ගබඩා සංඛ්‍යාව 180 ක් පමණ වූ අතර, තොග පාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම වෙනුවෙන් සේවයේ යොදවා තිබුණු සහකාර ප්‍රාදේශීය කළමණාකාර හා ගබඩා සහකාර නිලධාරීන් සංඛ්‍යාව 78 ක් විය. නව තනතුරු අනුමත කරවා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ප්‍රධාන විධායක තනතුරක් වන සාමාන්‍යාධිකාරී තනතුර සඳහා 2011 මැයි 03 දින නිලධාරියෙකු බඳවාගෙන තිබුණද, එය අවිධිමත් ලෙස සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මෙම තනතුරට අදාල අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද සපුරා නොතිබීම මත මෙම පත්වීම මතභේදාත්මක පත්වීමක් වී තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 15 ක ප්‍රමාදයකින් පසුව 2013 මැයි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි ආදායම් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය දැක්වෙන ලෙස අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. අයවැය ලේඛනයේ වියදම් වර්ගීකරණයද මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණයට අනුරූපී නොවූ නිසා ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර වූ විචලනයන් ගණනය කළ නොහැකි විය. ඒ අනුව, අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) වත්කම් පාලනය
(ඈ) ගබඩා පාලනය
(ඉ) අයවැය පාලනය
(ඊ) කාර්ය මණ්ඩල

(උ) වී මෝල් හිමියන්ට බලපත්‍ර නිකුත් කිරීම